# පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරු (ESIA) වාර්තාවේ සවිස්තරාත්මක සාරාංශය

## 1. ව්‍යාපෘති සමාලෝචනය




කෙරවලපිටිය - වරාය 220kV දෙවන භූගත කේබල් ව්‍යාපෘතියේ ඉදිකිරීම් යටතේ කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළ (GSS) සහ කොළඹ වරාය ජාල උපපොළ අතර කිලෝමීටර් 15.6 ක භූගත සම්ප්‍රේෂණ මාර්ගයක් (UG/TL) එළීම සමන්විත වේ.

භූගත කේබල් මාර්ගය කෙරවලපිටිය GSS ඇතුළත කිලෝමීටර 0.10 ක දිගක් එලනු ලැබේ. ඉන්පසු කෙරවලපිටිය GSS හි ප්‍රවේශ මාර්ගය ඔස්සේ, කිලෝමීටර 0.43 ක දුරක් විහිදෙන අතර, එහි වම් පස භාවිතා කරනු ලැබේ. CPSTL පර්යන්ත මිරගයේ සිට කෙරවලපිටිය පාර දක්වා කිලෝමීටර 1.95 ක දිගක් මාර්ගයේ දකුණු පසින් ඉදිකරනු ඇත. කිලෝමීටර් 2.6ක් කෙරවලපිටිය මාර්ග කොටස තුල වම් පස භාවිතා කරන අතර, හැඳල මාර්ගයේ කිලෝමීටර් 0.26 ක්, අල්විස් නගර මාවතේ කිලෝමීටර් 1.10 ක් , සහ ASP ලියනගේ මාවතේ කිලෝමීටර් 0.95 දකුණු පස භාවිතා කරයි. වත්තල/හේකිත්ත පාර (0.84 km), පරණ මීගමුව පාර (0.55 km), සහ ශ්‍රීමත් රාමනාදන් මාවතේ (1.00 km) වම් පස භාවිතා වේ. මට්ටකුලිය සෙන්ටර් පාරේ කිලෝමීටර් 0.70ක් සහ අලුත් මාවතේ කොටසකට සහ අලුත් මාවතේ කිලෝමීටර් 1.85ක් සඳහා මාර්ගයේ මැද භාවිත කරනු ඇත. ශාන්ත අන්තෝනි මාවත (කි.මී. 0.30), එන්.එච්.එම්. අබ්දුල් කාදර් මාවත (කි.මී. 1.10), ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත (කි.මී. 0.68), ජනාධිපති මාවත (කි.මී. 0.21), ගාලු බක් පාර/ඉහළ වැතම් වීදිය (කි.මී. 0.25) යන සියලුම මාර්ග වල වම් පස භාවිතා වේ. අවසාන වශයෙන්, වරාය උපපොළ දක්වා (කිලෝමීටර් 0.20) වෛත්‍ය මාර්ගයේ දකුණු පස භාවිතා වේ.

වැඩිවන විදුලි ඉල්ලුම සපුරාලීමට සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ඒකාබද්ධ කිරීමට සහාය වීම සඳහා අත්‍යවශ්‍ය වන මහ කොළඹ ප්‍රදේශයේ බලශක්ති සම්ප්‍රේෂණයේ විශ්වසනීයත්වය සහ ධාරිතාව ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණකි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය USD මිලියන 61 ක් වන අතර, අපේක්ෂිත ඉදිකිරීම් කාලය මාස 18 කි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විසිනි. ආසියා යටිතල ආයෝජන බැංකුව (Asian Infrastructure Investment Bank (AIIB)) මෙම ව්‍යාපෘතිය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 52 ක ණය මුදලක් ලබා දෙනු ඇත. ශ්‍රී ලංකා රජය (GOSL) USD මිලියන 9 ක ප්‍රතිපක්ෂ අරමුදල් සපයනු ඇත.

## 2. ව්‍යාපෘති සාධාරණීකරණය

ජපන් ODA ණය මුදලක් යටතේ මහ කොළඹ විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ වල හානි අවම කිරීමේ ව්‍යාපෘතියේ (GCTDLRP) පළමු අදියර CEB විසින් සම්පූර්ණ කර ඇත. තවද, කෙරවලපිටිය තාප විදුලි බලාගාරය සහ නගර මධ්‍යයේ කොළඹ වරායේ GSS අතර 220kV භූගත සම්ප්‍රේෂණ මාර්ගයක් (UG/TL පළමු පරිපථය) සඳහා 2018 දී ඉදිකරන ලදී. ඉන් අනතුරුව, Tokyo Power Electric Co. Ltd විසින් සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලද අතර සවිස්තරාත්මක ශක්‍යතා වාර්තාවක් (DFR) 2019 මැයි මාසයේදී CEB වෙත ඉදිරිපත් කරන ලදී. කෙරවලපිටියේ දෙවන පරිපථය - වරාය 220kV සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස සාධාරණීකරණය කරන ලදී. දෙවන භූගත සම්ප්‍රේෂණ මාර්ග (UG/TL) ව්‍යාපෘතියේ ඉලක්කය වන්නේ මහ කොළඹ නාගරික සංවර්ධන ප්‍රදේශයේ විදුලි සම්ප්‍රේෂණ මාර්ගයේ ධාරිතාව වැඩි කිරීම සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීමයි. මෙම ව්‍යාපෘතිය මගින් දැනට පවතින සම්ප්‍රේෂණ ජාලය ශක්තිමත් කිරීමටත්,

මහ කොළඹ නාගරික සංවර්ධන ප්‍රදේශයේ විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමටත්, සම්ප්‍රේෂණ හානි අවම කිරීමටත් හැකි වේ.

රජයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්ති ඉලක්ක (2030 වන විට 70%) සාක්ෂාත් කර ගැනීමේ අරමුණ ඉටුකර ගැනීමට විදුලිය ලබා ගැනීම සඳහා කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළේ සිට කොළඹ වරාය ජාල උපපොළ දක්වා දෙවන භූගත කේබලය අත්‍යාවශ්‍ය වේ. දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ ඉහළ වර්ධනයත් සමඟ, කොළඹ නගරයේ විදුලි ධාරිතා මධ්‍යස්ථාන සඳහා පුනර්ජනනීය බලශක්තිය ,බෙදාහැරීමේ ප්‍රධාන ස්විචින් ස්ථානය ලෙස CEB විසින් කෙරවලපිටිය හඳුනාගෙන ඇත. CEB ජනන සහ සම්ප්‍රේෂණ සැලැස්මට අනුව, හඳුනාගෙන ඇති පුනර්ජනනීය බලශක්ති මධ්‍යස්ථාන ඒකාබද්ධ කිරීමට රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල යෝජිත පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සහ සැලසුම්ගත සම්ප්‍රේෂණ මාර්ග සංවර්ධන යෝජනා කර ඇත.

## 3. ESIA සඳහා අරමුණ, ක්‍රමවේදය සහ විෂය පථය

යෝජිත ව්‍යාපෘතියේ පාරිසරික හා සමාජීය අවදානම් සහ බලපෑම් සහ ඊට අනුරූප අවම කිරීමේ පියවර හඳුනාගැනීමේ අරමුණ ඇතිව මෙම පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරු වාර්තාව (ESIA) සහ පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP) සකස් කරන ලදී.

සම්ප්‍රේෂණ මාර්ග පෙළගැස්මේ කිලෝමීටර 15.6 ක දුරක් සහ එහි ආසන්නතම මාර්ග අවසරය (ROW) සහ උපපොළ දෙකේ හි ස්ථාන සහ ඒ ආශ්‍රිත පහසුකම් ආවරණය වන පරිදි පාරිසරික හා සමාජීය බලපෑම් තක්සේරුව සිදු කරන ලදී. කිලෝමීටර් 15.6 ක මාර්ග පෙළගැස්ම කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ (DSD) ග්‍රාම නිලධාරී වසම් හයක් (GNDs) සහ වත්තල DSD හි GND පහක් හරහා පිහිටා ඇත.

ESIA සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලියට ඇතුළත් වන්නේ:

1. AIIB හි පාරිසරික සහ සමාජ රාමුව (ESF) ඇතුළුව ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව සහ අනෙකුත් අදාළ ලේඛන අධ්‍යයනය කිරීම;
2. CEB හි ඉංජිනේරු කාර්ය මණ්ඩලය සහ AIIB හි නිලධාරීන් සමඟ උපදේශන;
3. පාර්ශ්වකරුවන්ගේ උපදේශන;
4. ද්විතීයික මූලාශ්‍ර, ක්ෂේත්‍ර චාරිකා, මාර්ග සමීක්ෂණයක් සහ නිවැසියන් හමුවීම හරහා පාරිසරික සහ සමාජීය මූලික දත්ත රැස් කිරීම;
5. දත්ත විශ්ලේෂණය සහ බලපෑම් තක්සේරු කිරීම සහ ESIA/ESMP වාර්තා කෙටුම්පත් කිරීම;
6. ලේඛන සමාලෝචනය (CEB සහ AIIB විසින්) සහ ලේඛන අවසන් කිරීම

## 4. අදාළ ප්‍රතිපත්ති, නීති සහ රෙගුලාසි.

මෙම ව්‍යාපෘතිය ජාතික පාරිසරික පනත (NEA) යටතේ පාරිසරික බලපෑම් තක්සේරු (EIA) රෙගුලාසිවල නියමිත ලැයිස්තුවට අයත් නොවේ. එසේ වුවද, ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු අදාළ පාරිසරික බලපෑම් ඇගයීම් රෙගුලාසි යටතේ නියම කර ඇති ජාතික පාරිසරික තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. තවද මාර්ග සංවර්ධන අධිකාරිය (RDA), කොළඹ මහ නගර සභාව (CMC) සහ අනෙකුත් අදාළ පළාත් පාලන ආයතන ඇතුළු ආයතන ගණනාවකින් අනුමැතිය ලබාගැනීමට නියමිතව තිබුණි. (2.3 වගන්තිය බලන්න). ESIA, AIIB හි පාරිසරික සහ සමාජ රාමුවට (ESF) අනුකූල වනු ඇත. ව්‍යාපෘතියේ පාරිසරික හා සමාජීය අවදානම් සහ බලපෑම් තාවකාලික (බොහෝ විට ඉදිකිරීම් අදියරේදී) සහ මධ්‍යස්ථ වනු ඇතැයි අපේක්ෂා කරන බැවින් මෙම ව්‍යාපෘතිය 'B" කාණ්ඩයේ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. ව්‍යාපෘතිය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඍජුවම අදාළ වන ප්‍රධාන රෙගුලාසි සහ නීති පහත දැක්වේ.

1. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත, 2013 අංක 31 දරන පනත මගින් සංශෝධනය කරන ලද පනත.
2. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත.
3. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ එහි සංශෝධන (1988 අංක 56 සහ 2000 අංක 53) සහ පහත සඳහන් රෙගුලාසි.
4. 2009 අංක 8 දරන මෝටර් රථ ප්‍රවාහන (සංශෝධන) පනත.
5. 1993 අංක 49 දරන පනත මගින් සංශෝධිත වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනත සහ පසුව සංශෝධන.

6. 1862 අංක 15 දරන හිංසන ආඥාපනත 230 පරිච්ඡේදය.
7. ජාතික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රතිපත්ති 2014.

## 5. ඉදිකිරීම් ක්‍රමවේදය

කෙරවලපිටිය GSS හි භූගත කේබල් මාර්ග ව්‍යාපෘතියට අදාල විශාලඉදිකිරීම් ක්‍රියාවන්, ඉදිකිරීම් ද්‍රව්‍ය භූමියට ප්‍රවාහනය , පරීක්ෂා කිරීමේ වළවල් කැනීම, අගල් කැණීම, කේබල් එලීම, මාර්ග ප්‍රතිස්ථාපනය, ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ඉවත් කිරීම ඇතුළු පුළුල් ඉදිකිරීම් කටයුතු ඇතුළත් වේ. ප්‍රධාන මාර්ගවල කැණීම් කරන ලද අගල්වල භූගත කේබල් අතුරා ඇති අතර, සමහර කොටස් මාර්ගවල වම් පසින් ද, අනෙක් ඒවා දකුණට ද, තවත් සමහරක් මධ්‍යයේ ද සකස් කරනු ලැබේ. විවෘත කැපුම් ක්‍රමයට අවම වශයෙන් කිලෝමීටර් 15ක් පමණ අගලේ කැණීම් කරන අතර, කෙරවලපිටිය-වරාය 220kV පළමු අදියර කේබලය ඉදි කිරීමේදී තිරස් දිශානුගත විදුම් (HDD) භාවිතයෙන් 2019 දී මීටර් 600ක් නිම කරන ලදී.

ඉදිකිරීම් අතරතුර, මාර්ග වසා දැමීම හෝ අර්ධ වශයෙන් වසා දැමීම, ආරක්ෂාව සහ අවම බාධා කිරීම් සහතික කිරීම සඳහා රථවාහන සහ පදිකයින් සඳහා පහසුව සලසන මාරග හැරවුම් ස්ථාපිත කරනු ලැබේ. කැණීම් යන්ත්‍ර සහ වායුරෝධක කැනීම් යන්ත්‍ර (pneumatic drills) භාවිතයෙන් අගල් කැනීම් කරන අතර භූමියට ගෙන එන ලද පසු පිරවුම් ද්‍රව්‍ය හෝ කැණීමෙන් ලබාගත් ද්‍රව්‍ය නැවත පිරවීමට හෝ භාවිතා කරනු ලැබේ. තාර පාර මතුපිට සුමට නිමාවක් සහතික කිරීම සඳහා විශේෂිත යන්ත්‍රෝපකරණ භාවිතයෙන් නැවත සකස් කරනු ලැබේ. නියමිත ස්ථානයකින් ආරම්භ කර ක්‍රමානුකූලව වරකට මීටර් 30ක් පමණ විහිදෙන පරිදි, අඛණ්ඩව කොටස් වශයෙන් වැඩ නිම කරනු ලැබේ. මෙම ඉදිකිරීම් අදියරයන් ක්‍රියාත්මක කිරීම මගින් ඉදිකිරීම් කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සහ අවට ප්‍රදේශවලට ඇති වන බලපෑම අවම කිරීමට ඉඩ සලසනු ඇත.

මාර්ගය අසල වෙළඳාමේ නිරත වෙළෙන්දන්ගේ ජීවනෝපාය සඳහා වන බලපෑම අවම කිරීම සඳහා, පියවර කිහිපයක් ක්‍රියාත්මක කිරීමට CEB කැපවී සිටී. ව්‍යාපෘති කාලසටහන පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට සහ පැහැදිලි කාලසටහන් සැපයීමට සැලසුම් ක්‍රියාවලියේ මුල් අවස්ථාවේදීම CEB විසින් වෙළෙන්දන් සමඟ සම්බන්ධ වනු ඇත. අවශ්‍ය නම් තාවකාලික නැවත ස්ථානගත කිරීම සඳහා සහාය ලබා දෙනු ඇත, වෙළෙන්දන්ට ඔවුන්ගේ මෙහෙයුම් ඒ අසලම කරගෙන යා හැකි බව සහතික කරනු ඇත. මීට අමතරව, වෙළෙන්දන්ගේ ක්‍රියාකාරකම් අඩු වූ විට කාර්ය බහුල නොවන වේලාවන්හි වැඩ කාලසටහන්ගත කිරීම වැනි බාධා අවම වන අයුරින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම CEB සහතික කරනු ඇත. රාත්‍රී-කාල සහ සති අන්තයේ කළ හැකි වැඩ මෙයට ඇතුළත් වේ. වෙළෙන්දන්ට ඕනෑම ගැටළුවක් වාර්තා කිරීමට සහ කාලීන විසඳුම් සහ සාධාරණ වන්දි ලබා දීම සඳහා දුක්ගැනවිලි යාන්ත්‍රණයක් CEB විසින් ස්ථාපිත කරනු ඇත. මෙම ක්‍රියාකාරී ප්‍රවේශය වෙළෙන්දන් මත ආර්ථික බලපෑම අවම කිරීම සහ ධනාත්මක ප්‍රජා සබඳතා පවත්වා ගැනීම අරමුණු මත පදනම් වේ.

## 6. ව්‍යාපෘති විකල්ප

විකල්ප විශ්ලේෂණය කිරීමේදී, 'ව්‍යාපෘතියක් නැත විකල්ප' සමඟ අවම වශයෙන් මාර්ග විකල්ප දෙකක් සලකා බලන ලදී. එම මාර්ගයේ කේබල් අගල් කැනීම් සඳහා විකල්ප මාර්ග දෙකක් ඇති අතර, ඉන් එකක් වනුයේ විකල්ප 'බී' යටතේ විස්තර කර ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිශ්‍රය තුළ ඇති මාර්ගය හරහා පෙළගැස්වීම සහ තවත් මාර්ගයක් විකල්ප 'A' යටතේ පැහැදිලි කර ඇති වරාය පරිශ්‍රයෙන් පිටතින් ඉදිකිරීම වේ. අබ්දුල් කාදර් මාවතේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගේට්ටුව 03 හරහා වරාය උපපොළ දක්වා හර්ටාල් පාලම හරහා සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිශ්‍රය තුළ ඇති විකල්ප මාර්ගයෙහි අවාසි කිහිපයක් ඇති බැවින් මාර්ග පෙළගැස්ම ‘A’ තිබීම වඩාත් ශක්‍ය මාර්ගය ලෙස CEB සලකනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිශ්‍රය තුළ ඇති සීමා සහිත ප්‍රදේශ හේතුවෙන් මෙම මාර්ගයේ සීමිත ප්‍රවේශ්‍යතාව සඳහා විශේෂ අවසරයන් අවශ්‍ය වන අතර, ව්‍යාපෘතියේ ප්‍රවාහණ සංකීර්ණත්වය වැඩි වනු ඇත. මෙම සීමා සහිත ප්‍රදේශ හරහා ගමන් කිරීම ප්‍රමාදයන් ඇතිවීම් සහ ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ වීමට හේතු විය හැක. වරාය ප්‍රදේශය තුළ වැඩිදියුණු කරන ලද ආරක්ෂක පියවරයන් ඉදිකිරීම් කටයුතු තවදුරටත් මන්දගාමී විය හැකි අතර අමතර සම්බන්ධීකරණ කාර්යන් අවශ්‍ය වේ. මෙම සාධක සාමූහිකව සැලකූ විට මෙම විකල්ප මාර්ගය අනෙකුත් විකල්පයන්ට සාපේක්ෂව අඩු වාසිදායක බවට පැහැදිලි වේ.

## 7. සමාජීය සහ පාරිසරික මූලික තොරතුරු සහ බලපෑම් විශ්ලේෂණය

නිවාස ඒකක, ව්‍යාපාරික මධ්‍යස්ථාන සහ ඉදිකිරීම් කටයුතු වලදී අහිතකර ලෙස බලපෑ හැකි කේබල් එලන මාර්ගයේ අසල දෙපස පැරපෙට් තාප්ප, රෝලර් දොරවල් සහ මංසන්ධි වැනි වෙනත් යටිතල පහසුකම් ගණනාවක් ඇත.

| පාලම්/බෝක්කු | අතුරු මාර්ග, මංසන්ධි/ වටරවුම | විවෘත පිවිසුම් සහිත නිවාස | වෙනත් වෙළඳ සැල්/සාප්පු ගොඩනැගිලි | ආගමික ස්ථාන/ පිළිම | පැරපෙට් තාප්ප සහ ගේට්ටු | වාහන සහ ත්‍රිරෝද රථ නැවතුම් ස්ථාන | පාසල් / රෝහල් / පොලිසිය |
|---|---|---|---|---|---|---|---|
| 14 | 70 | 64 | 159 | 09 | 85 | 12 | 09 |

බොහෝ මාර්ග කොටස් දිගේ නිවාස ඝනත්වය ඉහළ මට්ටමක ඇත. මාර්ග කොටස්වල භූගත ජල සැපයුම, මලාපවහන, විදුලි බල සහ විදුලි සංදේශ වැනි අනෙකුත් උපයෝගිතා සඳහා වළලන ලද පයිප්ප ද අඩංගු වේ. මාර්ග රථවාහන තදබදයෙන් පිරී ඇත. CMC, RDA, වත්තල ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ ග්‍රාම නිලධාරීන්ගේ නියෝජිතයින් සහ මාර්ගය දෙපස පදිංචිකරුවන් කිහිප දෙනෙකුගෙන් අදහස් විමසන ලදී. ඇතිවිය හැකි බලපෑම් තක්සේරු කිරීම සඳහා 2024 වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ CMC මෙන්ම අනෙකුත් පාර්ශවකරුවන් සමඟ උපදේශන සිදු කර ඇත. ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන පාර්ශ්වකරුවන්ගෙන් විශාල විරෝධයක් මතු නොවීය.

ව්‍යාපෘති ප්‍රදේශයේ භූ විෂමතාවය කුඩා කඳු ගැට සහිත තැනිතලා සහ පහත් බිම් සහිත සමතලා බිම් වලින් සංලක්ෂිත වේ. ගම්පහ දිස්ත්‍රික්කයේ මුතුරාජවෙල වගුරුබිම සහ මීගමුව කලපුව සහ කොළඹ ඇල ජාලය (බේරේ වැව) ව්‍යාපෘතියේ සිට කිලෝමීටර් 10ක් ඇතුළත ප්‍රධාන පාරිසරික ප්‍රදේශ වේ. මුතුරාජවෙල තෙත් බිම පුළුල් කිවුල් වගුරු බිම්, කඩොලාන වගුරු බිම් සහ මිරිදිය වගුරු බිම් වලින් සමන්විත වේ. ප්‍රධාන මතුපිට ජල මූලාශ්‍රවලට කැලණි ගඟ, බේරේ වැව සහ විවිධ ඇළ මාර්ග ඇතුළත් වන අතර ඒවා අඩු ද්‍රාව්‍ය ඔක්සිජන් මට්ටමකින් සහ ඉහළ කාබනික දූෂණකාරක වලින් දැඩි ලෙස දූෂිතව ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණය ඉතා නාගරීකරණය වී ඇති අතර සැලකිය යුතු වාණිජ ක්‍රියාකාරකම් සහිත වන අතර වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෙත් බිම් සහ කාර්මික ක්‍රියාකාරකම් වලින් සංලක්ෂිත භූමි පරිහරනයක් ඇත.

විශේෂයෙන්ම කර්මාන්ත 500කට අධික සංඛ්‍යාවක් ඇති කෙරවලපිටිය කාර්මික කලාපයේ රථ වාහන විමෝචනයන් මගින් සහ කාර්මික ක්‍රියාකාරකම් මගින් වාතයේ ගුණාත්මක භාවය පිරිහී ඇත. ප්‍රධාන වශයෙන් වාහන තදබදය හේතුවෙන් ව්‍යාපෘති ප්‍රදේශයේ ශබ්ද මට්ටම් නියාමන සීමාවන් ඉක්මවා ඇත. විවිධ සංවේදී ස්ථානවල මනිනු ලබන කම්පන මට්ටම්, අවසර ලත් සීමාවන්ට වඩා පහළින් පවතී. ජල තත්ත්ව පරීක්ෂණ වලට අනුව සැලකිය යුතු කාබනික දූෂණයක් පෙන්නුම් කරන අතර එහි අඩු ද්‍රාව්‍ය ඔක්සිජන් මට්ටම්, ඉහළ ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුමක් සහ රසායනික ඔක්සිජන් ඉල්ලුමක් සහිතව දැඩි දූෂණය අනාවරණය වේ. ඇල මාර්ගවල ජල හයසින්ත් (water hyacinth) තිබීම පෝෂක දූෂණය පිළිබඳ දෘශ්‍ය දර්ශකයකි.

### 7.1. පාර්ශවකරුවන්ගේ උපදේශනය

ප්‍රධාන පාර්ශවකරුවන් සහ ඔවුන්ගේ අනාගත සහභාගීත්වය

- විදුලිබල අමාත්‍යාංශය: විදුලිබල උත්පාදනය සහ සැපයුම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා වගකීම දරයි; ව්‍යාපෘති ක්‍රියාවලිය පුරාවට අඛණ්ඩ උපදේශනය අවශ්‍ය වේ.
- CEB (ලංකා විදුලිබල මණ්ඩලය): ව්‍යාපෘතිය සැලසුම් කිරීම, නිර්මාණ කිරීම සහ අධීක්ෂණය ඇතුළුව ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරනු ලැබේ; ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) පිහිටුවා පාරිසරික හා සමාජීය (E&S) නිලධාරීන් සමඟ කටයුතු කරනු ඇත.
- AIIB (ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව): මූල්‍යකරු ලෙස, නිසි අරමුදල් බෙදා හැරීම සහ E&S ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කරනු ඇත; ESIA/ESMP සකස් කිරීම සහ පසුවිපරම් කිරීමෙහි නියැලී සිටී.
- සිවිල් කොන්ත්‍රාත්කරුවන් සහ කම්කරුවන්: සියලුම සිවිල් වැඩ සහ E&S අනුකූලතා සඳහා වගකිව යුතුය; කළමනාකරණ සැලසුම් සකස් කර ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.
- පළාත් පාලන ආයතන (CMC සහ වත්තල ප්‍රාදේශීය සභාව): මාර්ගවලට අහිතකර බලපෑමක් ඇති නොවන බවට සහතික වීම; සැලසුම් කිරීම, අනුමත කිරීම් සහ රථවාහන කළමනාකරණයට සම්බන්ධ වේ.
- RDA/PRDA: ඔවුන්ගේ බල සීමාව තුළ මාර්ග කොටස් අධීක්ෂණය කිරීම; සැලසුම් සහ අනුමත කිරීම් වල නිරත වේ.

- උපයෝගිතා සපයන්නන් (NWSDB, SLT, Dialog): ඔවුන්ගේ සේවාවන් අවහිරතා නොවන බවට සහතික වීම; කැණීම් සහ ප්‍රතිසංස්කරණ වලදී උපදෙස් ලබා ගැනීම.
- ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරීවරුන්: සම්බන්ධීකරණයට සහ ප්‍රජාව දැනුවත් කිරීමට පහසුකම් සැලසීම; දුක්ගැනවිලි කළමනාකරණයට සහාය වීම.
- ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව: රථවාහන කළමනාකරණය සහ මහජන ආරක්ෂාව සහතික කිරීම; රථවාහන සැලසුම් සඳහා සහාය වීම.
- පදිංචිකරුවන් සහ ව්‍යාපාර: ඉදිකිරීම් මගින් සෘජුවම බලපෑමට ලක්වන; මහජනයා දැනුවත් කිරීමේ රැස්වීම්, සමීක්ෂණ සහ පසුවිපරම් යාන්ත්‍රණ හරහා සම්බන්ධ වේ.
- සිවිල් සමාජ සංවිධාන: පාරිසරික රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම; මහජනතාව දැනුවත් කිරීමේ රැස්වීම්වලට සම්බන්ධ වීම.
- පදිකයින් සහ වාහන භාවිතා කරන්නන්: අවම අපහසුතාවයක් සහතික කිරීම; රථවාහන සැලසුම් සහ මග හැරීම් පිළිබඳව දැනුවත් කරන ලදී
  උපදේශන ක්‍රියාවලිය
- මූලික උපදේශන (2021): පාරිසරික සහ සමාජ බලපෑම් තක්සේරුව (ESIA) කල් ඇතිව සකස් කිරීමේදී ප්‍රධාන පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම.
- මෑත උපදේශන (2024): ව්‍යාපෘති යාවත්කාලීන කිරීම් සාකච්ඡා කිරීම, ගැටළු විසඳීම සහ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සැලසුම් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්, පළාත් පාලන ආයතන සහ ප්‍රජා නියෝජිතයින් ඇතුළු පාර්ශවකරුවන් සමඟ පසු විපරම් රැස්වීම්.

**ප්‍රධාන සාකච්ඡා කරුණු**

- AIIB රැස්වීම්: සාකච්ඡා කරන ලද ESIA යාවත්කාලීන කිරීම්, සමාජ ගැටළු, විකල්ප විශ්ලේෂණය, නැවත පදිංචි කිරීමේ සැලසුම් සහ අඛණ්ඩ අධීක්ෂණය සහ ප්‍රගති වාර්තා කිරීමේ අවශ්‍යතාවය.
- පළාත් පාලන ආයතන (CMC): මාර්ග තදබදය, ඓතිහාසික ස්ථාන සහ බාධා අවම කිරීම සඳහා කේබල් එලීම සඳහා තාක්ෂණික විකල්ප. කසළ කළමනාකරණය සහ ආරක්ෂාව පිළිබඳ කොන්ත්‍රාත්කරුගේ වගකීම අවධාරණය කර ඇත.
- ප්‍රජා රැස්වීම්: ඉදිකිරීම් බලපෑම්, ජලය කාන්දු වීම, මාර්ග තදබදය සහ ආරක්ෂාව පිළිබඳව නිවැසියන් කනස්සල්ල පළ කළහ. මේ සඳහා යෝජනා ලෙස, පාංශු පරීක්ෂාව, විකල්ප කේබල් මාර්ග සහ කොන්ත්‍රාත්කරුවන් හොඳම භාවිතයන් අනුගමනය කිරීම සහතික කිරීම සහ ඉදිකිරීම් අතරතුර තාවකාලික ප්‍රවේශය ලබා දීම ඇතුළත් විය.
- වෙළන්දන් සමග සාකච්ඡා: වෙළෙන්දෝ ව්‍යාපාර කඩා වැටීම ගැන කනස්සල්ල පළ කළ නමුත් තාවකාලික නැවත ස්ථානගත කිරීම් සහ ඉදිකිරීම් කාලසටහන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැමැත්තක් දැක්වූහ.
- මෙම සාරාංශය ව්‍යාපෘතියේ පාර්ශ්වකරුවන්ගේ උපදේශන ක්‍රියාවලිය, අඛණ්ඩ නියැලීම අවධාරණය කිරීම, ගැටළු විසඳීම සහ පාරිසරික සහ සමාජ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරනු ඇත.

## 8. ව්‍යාපෘතියේ සැලකිය යුතු බලපෑම්

පවතින මූලික දත්ත පරීක්ෂා කිරීමෙන් ව්‍යාපෘතියේ සමාජ, පාරිසරික සහ සෞඛ්‍ය සහ ආරක්ෂිත බලපෑම් තක්සේරු කරන ලදී. ව්‍යාපෘතියේ පූර්ව ඉදිකිරීම්, ඉදිකිරීම් අදියර සහ මෙහෙයුම් අදියර පිළිබඳව බලපෑම් හඳුනාගෙන ඇත. මාර්ග ජාලය ඔස්සේ UG T/L ඉදිකිරීම හේතුවෙන්, විශේෂයෙන් ඉදිකිරීම් අදියරේදී සැලකිය යුතු නමුත් ආපසු හැරවිය හැකි ඍණාත්මක සමාජ සහ ආරක්ෂාව සම්බන්ධ බලපෑම් ඇති වීමේ හැකියාවක් පවතී.

**පාරිසරික බලපෑම් සහ අවම කිරීම**

- **පරීක්ෂණ වලවල් කැනීමේදී උපයෝගිතා සේවා සඳහා හදිසි බලපෑම්**
    - කැණීමට පෙර CMC අනුමැතිය (ජලාපවහන බලපත්‍රය) ලබා ගැනීම.
    - කැණීම් කාලසටහන පිළිබඳව උපයෝගිතා සේවා සපයන්නන් සහ අවට පදිංචිකරුවන් දැනුවත් කිරීම.
    - හදිසි අනතුරු අලාභයක් ගැන වහාම සේවා සපයන්නන් දැනුවත් කිරීම.
    - උපයෝගිතා සපයන්නන් විසින් සිදු කරන ලද ඕනෑම හානියක් ප්‍රතිසාධනය කිරීම සහ වියදම් ප්‍රතිපූරණය කිරීම.

- කැණීම් කරන ලද ප්‍රදේශ පෙර පැවති තත්ත්වයට පත් කිරීම.

- **පරීක්ෂණ වලවල් කැණීම් වලදී ඇතිවන ශබ්දය සහ දූවිලි**
  - ශබ්දය අඩු කිරීමේ උපකරණ ස්ථාපනය කිරීම (උදා: පිටාර සයිලන්සර්).
  - පීඩාකාරී ශබ්දයක් ඇති නොවන හොඳින් නඩත්තු කරන ලද යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම.
  - කැණීමට පෙර සහ කැණීමේදී පරීක්ෂන වළ ප්‍රදේශ ජලයෙන් ඉසීම.

- **කම්පනය හේතුවෙන් ආසන්න ව්‍යුහයන්ට හානි වීම**
  - ව්‍යාපෘති භූමියේ සිට මීටර් 10ක් ඇතුළත ව්‍යුහයන් වල පූර්ව පිපුරුම් සමීක්ෂණයක් පැවැත්වීම.
  - ව්‍යාපෘති ඉංජිනේරුවරයාට පූර්ව පිපුරුම් සමීක්ෂණයේ පිටපතක් ඉදිරිපත් කිරීම.
  - යම් හානියක් සඳහා ප්‍රතිසංස්කරනයට හෝ වන්දි ගෙවීමට සැලැස්මක් සකස් කිරීම.

- **මාර්ගය  අසල ගස් කැපීම**
  - ගස් හිමිකරුවන්/ බලධාරීන්ගෙන් පූර්ව අවසරය ලබා ගැනීම.
  - ගස් කැපීමේදී ආරක්ෂක පියවරයන් අනුගමනය කිරීම.
  - වාහන ගමනාගමනයට බාධා නොවන කපා දැමූ ගස් වහාම ඉවත් කිරීම.

- **ඇළ මාර්ග සහ අනෙකුත් මතුපිට ජල මූලාශ්‍ර දූෂණය වීම**
  - රොන් මඩ සහිත අවසාදිත ජලය ජල මාර්ගවලට බැසයාම වැළැක්වීම සඳහා රොන්මඩ උගුල් හෝ රොන්මඩ වැටවල් ඉදි කිරීම.
  - තාවකාලික පස් කඳු කඩිනමින් ඉවත් කර වර්ෂාවට නිරාවරණය වීම වළක්වා ගැනීම.
  - කාර්ය සාධනය සහ අනුකූලතාවය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රන ඒකක, ඇස්ෆල්ට් ඒකක සහ ක්‍රෂර් යන්ත්‍ර නිරීක්ෂණය කිරීම.
  - ඝන ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කේන්ද්‍රාපසාරක ඩෙකේටර් සහිත HDD යන්ත්‍ර භාවිතය.

- **ඉදිකිරීම් සහ කඩා දැමූ (CD) අපද්‍රව්‍ය සහ ඉවත දමන තෙල් බැහැර කිරීම**
  - නිසි අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
  - CD අපද්‍රව්‍ය බැහැර කිරීම ලේඛනගත කර ලේඛනාගාරයක් පවත්වාගෙන යාම.
  - කසළ බැහැර කිරීම සඳහා අදාළ බලධාරීන්ගෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීම.
  - වාහන අංගනවල ආරක්ෂිත තෙල් ගබඩා පහසුකම් ඇති බවට සහතික වීම

**සමාජ බලපෑම් සහ අවම කිරීම**

- **මාර්ග අසල වෙළෙන්දන්ගේ ජීවනෝපායට බාධා වීම්**
  - දිවා කාලයේදී විවෘත අගල් යකඩ තහඩු වලින් ආවරණය කිරීම.
  - ඉදිකිරීම් ද්‍රව්‍ය මාර්ග අසල ගබඩා කිරීමෙන් වැලකීම.
  - කුඩා පරිමාණ වෙළෙන්දන්ට සහ ත්‍රිරෝද රථ හිමියන්ට තාවකාලික ස්ථාන වලට මාරුවීම් සඳහා සහය වීම.
  - අවතැන් වීම නිසා අහිමි වූ ආදායම සඳහා වන්දි ලබා දීම.
  - අවශ්‍ය නම් ව්‍යාපාර වෙත විකල්ප ප්‍රවේශය ලබා දීම

- **රථ වාහන තදබදය**

  - රාත්‍රී 10:00 සිට පෙ.ව. 6:00 දක්වා ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සහ තදබදය වැඩි වේලාවන් මග හැරීම.
  - රථවාහන කළමනාකරණ සැලැස්මක් (TMP) සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම.
  - අනතුරු වළක්වා ගැනීම සඳහා එක රයකින් අගල් වසා දැමීම.
- **ගබඩා කිරීම, කම්කරු කඳවුරු, වාහන නැවැත්වීම සඳහා තාවකාලිකව බදු දුන්/කුලියට ගත් ඉඩම අනිසි ලෙස භාවිතා කිරීම**
  - තාවකාලික ඉඩම් භාවිතය සඳහා නීතිමය ගිවිසුම් සහතික කිරීම.
  - දේපල ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක නිලධාරීන් යෙදවීම.
  - නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ මාර්ග ස්ථාපිත කිරීම
- **මහජනතාව දැනුවත් නොවීම**
  - ඉදිකිරීමට පෙර ප්‍රජා දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීම.
  - මහජන ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
  - දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා දිරි දීමනා ලබා දීම.
  - අවශ්‍ය නම් මාර්ග අසල වෙළෙන්දන් තාවකාලිකව නැවත ස්ථානගත කිරීම සඳහා උපදෙස් ලබා ගැනීම සහ සැලසුම් කිරීම.
- **මාර්ගය අසල නිවාස වලට ප්‍රවේශ බාධා ඇති වීම**
  - විවෘත අගල් නැවත පිරවීම සහ එදිනම මාර්ග නැවත ස්ථාපිත කිරීම.
  - පදිකයන්ට සහ වාහන පදවන්නන්ට තාවකාලික විකල්ප ප්‍රවේශයක් ලබා දීම.

**සෞඛ්‍ය සහ ආරක්ෂාව**

- **පරීක්ෂා කර බැලීමේ වළවල් කැණීමේදී අනතුරු ඇතිවීමේ අවදානම**
  - කැණීම් ප්‍රදේශවල බාධක පටි, සුදුසු සංඥා, නිසි ආලෝකකරණය සහ සංඥාකරුවන් සවි කිරීම.
- **කම්කරුවන්ට වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ අවදානම්**
  - රෙගුලාසිවලට අනුකූලව සෞඛ්‍ය සහ ආරක්ෂිත සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
  - කම්කරුවන් සඳහා දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
  - අවශ්‍ය ආරක්ෂක උපකරණ/PPE (උදා: ඇස් කණ්ණාඩි, හිස්වැසුම්, කන් පේනු) සැපයීම.
  - අදාළ සියලුම භාෂාවලින් පැහැදිලි ආරක්ෂිත සංඥා ප්‍රදර්ශනය කිරීම.
  - සියලුම සේවකයින් සඳහා මූලික ස්ථානීය ආරක්ෂණ පුහුණුවීම් පැවැත්වීම
- **අනතුරු අවදානම**
  - ව්‍යාපෘති භූමයට අදාළ අනතුරු සඳහා සාමාන්‍ය ලේඛනයක් පවත්වාගෙන යාම.
  - හදිසි සූදානමක් හෝ මහජන ආරක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
  - කැණීම් ස්ථාන වල භාධක යෙදීම සහ දෘශ්‍යතාව සඳහා දැල්වෙන විදුලි පහන් සවි කිරීම.
  - ඉදිකිරීම් අතරතුර සිදුවන හානි/තුවාල සඳහා තෙවන පාර්ශවීය රක්ෂණයක් ලබා ගැනීම.

- **කම්කරු කඳවුරු, ද්‍රව්‍ය තොග ගබඩා කිරීමේ අංගන අක්‍රමවත් ලෙස කළමනාකරණය කිරීම**

- ජනාවාසවලින් බැහැරව කම්කරු කඳවුරු සහ ගබඩා අංගන ඇති කිරීම.
- විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම

- **කම්කරුවන් බඳවා ගැනීම**
  - කඳවුරු සඳහා අවශ්‍යතාවය අවම කිරීම සඳහා ශ්‍රම/නුපුහුණු වැඩ සඳහා දේශීය ශ්‍රමිකයින් බඳවා ගැනීම.
- **ළමා ශ්‍රමිකයන් භාවිතය**
  - අවුරුදු 14ට අඩු දරුවන් කිසිම ආකාරයක රැකියාවක නිරත නොවන බවට සහතික වීම.
  - අවුරුදු 18 ට අඩු කම්කරුවන් අනතුරුදායක වැඩ කිරීම තහනම් කරන මානව සම්පත් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- **බලහත්කාර ශ්‍රමය හෝ ජාවාරම් කරන ලද ශ්‍රමය භාවිතා කිරීම**
  - ඉදිකිරීම් කටයුතු සඳහා බලහත්කාරයෙන් හෝ බැඳුනු ශ්‍රමයක් යොදවා නැති බවට වග බලා ගැනීම.
- **ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, ලිංගික සූරාකෑම සහ හිරිහැර**
  - කාන්තා සේවිකාවන් සඳහා සුදුසු සනීපාරක්ෂක පහසුකම් සැපයීම.
  - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිව ශුන්‍ය දරාගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
  - ලිංගික හිරිහැර නිරීක්ෂණය කිරීම සහ වැළැක්වීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.
  - GBV වින්දිතයින්ට සහාය දක්වන සේවා සපයන්නන් පිළිබඳව කම්කරුවන් දැනුවත් කිරීම.
  - සියලුම සේවකයන්ට චර්යාධර්ම සංග්‍රහයක් ලබා දීම සහ එයට අනුකූල වීම සහතික කිරීම.
  - HIV සහ ලිංගාශ්‍රිත රෝග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- **ස්ත්‍රී පුරුෂ භේදය**
  - ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී සමාන අවස්ථා සහතික කිරීම.
  - ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී පුහුණුව සහ ධාරිතා සංවර්ධනය සැපයීම.
- **අවස්ථාව සොයා ගැනීම**
  - අදාළ පාර්ශ්වකරුවන් සමඟ අවස්ථා සොයා ගැනීමේ ක්‍රියා පටිපාටියක් අනුගමනය කර ක්‍රියාත්මක කිරීම.
- **පශ්චාත්-ඉදිකිරීම් අදියර**
  - තාවකාලිකව කුලියට/බද්දට ගත් ඉඩම එහි මුල් තත්ත්වයට පත් කිරීම.
  - කඩා ඉවත් කරන ලද ව්‍යුහයන්ගෙන් ද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම.
  - ඉදිකිරීම් ස්ථානවලින් බැහැර කල යුතු ද්‍රව්‍ය වහාම ඉවත් කිරීම.

## 9. පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP)

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සිවිල් කොන්ත්‍රාත්කරු සමඟ එක්ව ක්‍රියාත්මක කළ යුතු පාරිසරික හා සමාජීය බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ESMP හි ඇතුළත් කර ඇත. ESMP ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික සහ සංවිධානාත්මක ව්‍යුහයන් පැහැදිලි කර ඇති පාරිසරික හා සමාජ අධීක්ෂණ සැලැස්මක් ද සපයා ඇත. කාර්යභාරයන් සහ වගකීම්, හැකියාවන් සංවර්ධනය කිරීම /පුහුණු අවශ්‍යතා තොරතුරු හෙළිදරව් කිරීමේ උපාය

මාර්ගයක්, දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියා පටිපාටියක් සහ ESMP ක්‍රියාත්මක කිරීම සඳහා තාවකාලික අයවැයක් ඇතුළත් කර ඇත.




හැකියාවන් සංවර්ධනය කිරීම සහ පුහුණු වැඩසටහනට යටතේ කේබල් සවිකිරීම, පද්ධති ඒකාබද්ධ කිරීම සහ අධීක්ෂණය පිළිබඳ විස්තීරණ තාක්ෂණික පුහුණුව ඇතුළත් වේ. එය වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව, උපද්‍රව හඳුනා ගැනීම සහ පුද්ගලික ආරක්ෂක උපකරණ නිසි ලෙස භාවිතා කිරීම ඇතුළුව පාරිසරික සහ සමාජ ආරක්ෂණ, නියාමන අනුකූලතාවය සහ ආරක්ෂණ ක්‍රමවේදය අවධාරණය කර ඇත. සැලසුම් කිරීම, උපලේඛනගත කිරීම, අයවැයකරණය, තත්ත්ව කළමනාකරණය සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය වැනි ව්‍යාපෘති කළමනාකරණ කුසලතා ද මෙහි ආවරණය කරනු ලැබේ.

PMU විසින් ESIA සහ ESMP පාර්ශවකරුවන්ට දෘඪ පිටපත්වලින් සහ විද්‍යුත් වශයෙන් ප්‍රවේශ විය හැකි අතර, මෙම ලේඛන CEB සහ AIIB වෙබ් අඩවිවල පළ කරනු ඇත. උපදේශන සැසිවලදී ව්‍යාපෘති තොරතුරු බෙදාගනු ලබන අතර, ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් ව්‍යාපෘතියේ විෂය පථය, ඉදිකිරීම් ක්‍රියාකාරකම්, විය හැකි බාධා, බලපෑම් සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කරනු ඇත. ව්‍යාපෘතිය, බලපෑම්, ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි, කාල නියමයන් සහ දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියා පටිපාටි විස්තර කරන පෝස්ටර් සහ පත්‍රිකා වැනි මුද්‍රිත ද්‍රව්‍ය බෙදාහැර පොදු ස්ථානවල පළ කරනු ලැබේ.

ශබ්දය, කම්පනය, දූවිලි, ඉදිකිරීම් අපද්‍රව්‍ය එකතු වීම, මහජන උපයෝගිතාවලට ඇති විය හැකි බාධා, මාර්ග තදබදය සහ ජීවනෝපායේ ආදායම් අහිමිවීම වැනි ඉදිකිරීම් ක්‍රියාකාරකම්වලින් පැන නගින සැලකිය යුතු බලපෑම් අවම කිරීම සඳහා ප්‍රතිකර්ම මාලාවක් හඳුනාගෙන ඇත. වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය බලපෑම් සහ මහජන ආරක්ෂිත බලපෑම් අවම කිරීම ද ඉතා වැදගත් ලෙස සලකා ඇති අතර ESMP තුළ ඒවා අවම කිරීමට පියවර යෝජනා කර ඇත.

තවද, කොන්ත්‍රාත්කරු විසින් රථවාහන කළමනාකරණ සැලැස්මක් සහ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක්, සෞඛ්‍ය හා ආරක්ෂණ සැලැස්මක්, අපද්‍රව්‍ය බැහැර කිරීමේ සැලැස්මක් සහ හදිසි ප්‍රතිචාර සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ESMP ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා PMU සහ කොන්ත්‍රාත්කරු යන දෙකම වගකිව යුතුය. විශේෂයෙන්, කොන්ත්‍රාත්කරු විසින් නිරත වන පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක නිලධාරීන් විසින් ඉදිකිරීම් ශබ්දය, කම්පනය සහ වාතයේ ගුණාත්මකභාවය (දූවිලි) නිරීක්ෂණය කරනු ලැබේ. ESMP ක්‍රියාත්මක කිරීමේ සමස්ත පිරිවැය රුපියල් මිලියන 108 (US $360,000) පමණ වනු ඇත).

**10. දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය**

ඉදිකිරීම් ක්‍රියාකාරකම් හේතුවෙන් ප්‍රජා දුක්ගැනවිලි අපේක්ෂා කරනු ලැබේ. කේබල් තැබීමේ ප්‍රදේශය අසල පදිංචිකරුවන්ගෙන් විශේෂයෙන්ම ශබ්දය, කම්පනය, උපයෝගිතා බාධාවන් සහ ගොඩනැගිලි ව්‍යුහයන් වල ඉරිතැලීම් වලින් පීඩාවට පත් විය හැක. මෙය කළමනාකරණය කිරීම සඳහා දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් (GRM) ස්ථාපිත කර ව්‍යාපෘතියේ ජීවන චක්‍රය පුරා ක්‍රියාකාරීව පවතිනු ඇත. සිවිල් කොන්ත්‍රාත්කරු ප්‍රවේශමෙන් සැලසුම් කිරීම සහ ඉදිකිරීම් කළමනාකරණය තුළින් දුක්ගැනවිලි අවම කිරීමට පියවර ගනු ඇත. නමුත් අගතියට පත් පාර්ශ්වයන්ට සහන සෙවීමට කාලය ලබා දෙනු ඇත. දුක්ගැනවිලි ලබා ගැනීම, වාර්තා කිරීම සහ නිශ්චිත කාල රාමුවක් තුළ විනිවිදභාවයෙන් විසඳනු ලැබේ. මුලදී, දුක්ගැනවිලි අඩවි කාර්යාල මට්ටමින්, පසුව PMU මට්ටමින් සහ, අවශ්‍ය නම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විසඳනු ලැබේ. දුක්ගැනවිලි විසඳීම සඳහා එක් එක් මට්ටමින් කේන්ද්‍රස්ථාන සහ දුක්ගැනවිලි කමිටු ක්‍රියාත්මක වන බවට CEB සහතික කරනු ලබන අතර, දුක්ගැනවිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් කිරීමක් ප්‍රජාවන් අතර ඇති කරනු ඇත.

<u>පැමිණිලි / දුක්ගැනවිලි විසඳීම සඳහා මූලික මට්ටම (අඩවි මට්ටම):</u>

ඕනෑම අගතියට පත් පාර්ශ්වයකට තම දුක්ගැනවිලි සහ පැමිණිලි සිවිල් කොන්ත්‍රාත්කරු වෙත සෘජුවම වාචිකව (පුද්ගලිකව හෝ දුරකථනයෙන් හෝ කෙටි පණිවුඩ මගින්) හෝ ලිඛිතව වාර්තා කළ හැක. තවද, බලපෑමට ලක් වූ පාර්ශ්වයන්ගෙන් යම් දුක්ගැනවිලි හෝ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා පැමිණිලි පෙට්ටියක් ඉදිකිරීම් භූමියේ තබනු ලැබේ. වාචික මාර්ගයෙන් හෝ වෙනත් මාර්ගයකින් ලැබෙන සියලුම පැමිණිලි දුක්ගැනවිලි ලේඛනයේ සටහන් වේ. සටහන් වනු ඇති තොරතුරු වේ:

- යොමු අංකය
- පැමිණිල්ලේ දත්ත
- පැමිණිලිකරුගේ නම
- ස්ත්‍රී පුරුෂ භාවය
- ජාතික හැඳුනුම්පත් අංකය
- ලිපිනය
- පැමිණිල්ලේ සාරාංශය
- පැමිණිලිකරුගේ අත්සන

ව්‍යාපෘති ස්ථානය මට්ටමේ දුක්ගැනවිලි කමිටුවක් (GC) පිහිටුවනු ඇත:

- කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයා (ව්‍යාපෘති OHS නිලධාරියා) (මෙහෙයුම් ස්ථානය ලෙස සේවය කරයි)
- PMU නියෝජිත (පරිසර ඉංජිනේරු),
- සිවිල් සමාජ සංවිධානයක (CSO) සාමාජිකයෙකු හෝ ආගමික නායකයා
- GC හි ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් සහතික කිරීමේ අරමුණින් CSO හි කාන්තා නියෝජිතවරියක් ද ඇතුළත් කරනු ලැබේ.

කමිටුවේ ප්‍රධාන කාර්යය වනුයේ ප්‍රජා සාමාජිකයින් සහ ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු/සංවර්ධකයා අතර ආරවුල් ඇති පාර්ශ්වයන්ගේ නඩු විනිවිද භාවයෙන් හා සාධාරණව විභාග කිරීම මත පදනම්ව බේරුම්කරණය සහ සාකච්ඡා කිරීම වේ.

ව්‍යාපෘති භූමිය මට්ටමින් දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියා පටිපාටිය වනු ඇත:

- ව්‍යාපෘති භූමියේ OHS නිලධාරියා විසින් අදාළ දුක්ගැනවිලි හොඳින් අධ්‍යයනය කිරීමෙන් පසු දුක්ගැනවිලි කමිටුව (GC) කැඳවිය යුතුය. දුක්ගැනවිලි/අනුකූලත්වය විශ්වාසදායක බවත් සාකච්ඡා අවශ්‍ය බවත් මෙහෙයුම් ස්ථානයට ඒත්තු ගිය පසු ඔහු පහත ක්‍රියාමාර්ග ගනු ඇත.
- GC සඳහා සුදුසු දිනයක් සහ වේලාවක් තීරණය කිරීමෙන් පසු පීඩාවට පත් පාර්ශවයට සහ අනෙකුත් සාමාජිකයින්ට GC වෙත ආරාධනා කරනු ලැබේ. GC රැස්වීමේ දිනය සහ වේලාව අගතියට පත් පාර්ශ්වයට සහ GC සාමාජිකයින්ට කල්තියා දැනුම් දිය යුතුය.

- රැස්වීම සඳහා ස්ථානය කොන්ත්‍රාත්කරුගේ කාර්යාලය හෝ සියලු පාර්ශ්වයන් විසින් අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත් වෙනත් ස්ථානයක් විය හැකිය.
- සාමාජිකයන්ට දුක්ගැනවිලි පිළිබඳ පැහැදිලි අදහසක් ලබා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු සැපයිය යුතුය.
- නඩු විභාගය අතරතුර ව්‍යාපෘති භූමියේ සංචාරයක් සඳහා කිසියම් අවශ්‍යතාවයක් ඇත්නම්, මෙය සකස් කළ යුතුය;
- විමර්ශනය අතරතුර GC සාමාජිකයා වෙනත් ඕනෑම පාර්ශ්වකරුවෙකුගෙන් (රාජ්‍ය ආයතන / පුද්ගලික ආයතන, පුද්ගලයන් ආදිය) උපදෙස් ලබාගෙන ගැටලුවේ බරපතලකම හොඳින් තක්සේරු කළ යුතුය.

- බහුතර කැමැත්ත ඇති දුක්ගැනවිලි කමිටුව අගතියට පත් පුද්ගලයා සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් තීරණය කරනු ඇත.
- තීරණය අධවි කළමණාකරු වෙත දැනුම් දිය යුතු අතර අගතියට පත් පාර්ශ්වයට සහන ගැන දැනුම් දිය යුතුය.
- GC හි සියලුම කටයුතු අගතියට පත් පාර්ශ්වය කැමති භාෂාවකින් සිදු කිරීම.
- අවධානය යොමු කරන ලද, විසඳන ලද සහ ඉහළ බලධාරීන් වෙත යොමු කරන ලද සියලුම සිද්ධීන් පිළිබඳ දත්ත පදනමක් ද කේන්ද්‍රස්ථානය විසින් පවත්වාගෙන යනු ඇත.
- මෙහෙයුම් නිලධාරියා විසින් ව්‍යාපෘති කළමනාකාරීත්වය වෙත කාර්තුමය වාර්තාවක් ද ඉදිරිපත් කරනු ඇත.

GC හි පළමු රැස්වීමේ සිට දින 07 ක කාලයක් තුළ දුක්ගැනවිලි විසඳා අදාල පාර්ශවයන් දැනුවත් කළ යුතුය.

දුක්ගැනවිලි එක් රැස්වීමකින් විසඳාගත නොහැකි නම්, පරීක්ෂණ දිගටම කරගෙන යාමට ප්‍රමාදයකින් තොරව නැවත වාරයක් පැවැත්විය යුතුය.

අගතියට පත් පාර්ශ්වයට ඒත්තු ගැන්වෙන්නේ නැතිනම් හෝ ඔහු/ඇය ඉදිරිපත් කර ඇති විසඳුම සමඟ තර්ක නොකරන්නේ නම්, ඔහුට/ඇයට දෙවන මට්ටමට ප්‍රවේශ විය හැකිය.

<u>පැමිණිලි/ දුක්ගැනවිලි විසඳීම සඳහා දෙවන මට්ටම (PMU මට්ටම):</u>

ව්‍යාපෘති භූමිය මට්ටමින් අදාල පාර්ශ්වයන් ට පිළිගත හැකි මට්ටමට ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය නොකළ ඕනෑම ගැටළුවක් විසඳීම මෙහි අරමුණ වේ. එවැනි දුක්ගැනවිලි PMU මට්ටමේ දුක්ගැනවිලි කමිටුව වෙත යොමු කරනු ලැබේ.

PMU මට්ටමේ GC පිහිටුවනු ඇත්තේ:

- ව්‍යාපෘති කළමනාකරු නියෝජනය කිරීමට ව්‍යාපෘතියේ පරිසර ඉංජිනේරු (EE).
- සිවිල් කොන්ත්‍රාත්කරු (OHS නිලධාරියා) හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයා
- සිවිල් සමාජ සංවිධාන (CSO) හි නියෝජිතයෙක්.
- CSO හි කාන්තා නියෝජිතවරියක්
- අගතියට පත් පාර්ශ්වය විසින් නම් කළ යුතු වෙනත් ඕනෑම සාමාජිකයෙකු;

PMU විසින් GC රැස්වීම කැඳවීමට ප්‍රධාන / නාභිගත ලක්ෂ්‍යය ලෙස අධවි පරිසර ඉංජිනේරු (EE) සම්බන්ධ කර ගනු ඇත.

නොවිසඳුණු දුක්ගැනවිලි, GC ක්‍රියාදාමයේ පිටපත් සහ පැමිණිලිකරුගේ සම්බන්ධතා තොරතුරු, පැමිණිල්ල ලැබුණු දිනය, දුක්ගැනවිල්ලේ ස්වභාවය, එකඟ වූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ ඒවාට බලපෑ දිනය අවසාන ප්‍රතිඵලය වැනි අනෙකුත් විස්තර PMU හි නියමිත නිලධාරියා වෙත ලැබෙනු ඇත.

ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා වෙත එවැනි තොරතුරු ලැබුණු පසු, සහභාගිවන්නන්ට කල්තියා දැනුම් දීමෙන් පසු GC කැඳවිය යුතුය. GC හි සියලුම සාමාජිකයින්ට අදාළ දුක්ගැනවිලි පිළිබඳ තොරතුරු සැපයිය යුතුය.

පැමිණිල්ලට සහාය වීම සඳහා අමතර තොරතුරු වැඩිදුර ව්‍යාපෘති නිරීක්ෂන වලින් ලැබිය යුතුය.

යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය සහ එය ක්‍රියාත්මක කිරීමට නියමිත කාලසීමාව පැමිණිලිකරු සමඟ සාකච්ඡා කර එකඟතාවකට පැමිණිය යුතුය.

දුක්ගැනවිලි ලැබුණු දින සිට දින 14ක් ඇතුළත වාර්තා කරන ලද දුක්ගැනවිලි විසඳිය යුතුය.

<u>පැමිණිලි / දුක්ගැනවිලි විසඳීම සඳහා තෙවන මට්ටම (ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම):</u>

විශේෂයෙන්ම ඉඩම් අත්පත් කර ගැනීම් සහ වගාවන්ට සිදුවන වෙනත් හානිවලට අදාළ වන්දි ගෙවීම සම්බන්ධයෙන් මහජන පැමිණිලි විසඳීම සඳහා දුක්ගැනවිලි කමිටුවක් පිහිටුවීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUSCL) මගින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත බලතල පවරන චක්‍රලේඛ ඇත. ඉහත මට්ටම් දෙකේදීම ගනු ලැබූ තීරණය පිළිබඳව පීඩාවට පත් වූ පුද්ගලයා/පුද්ගලයන් සෑහීමකට පත් නොවන විට, පීඩාවට පත් පාර්ශ්වයට මහජන උපයෝගිතා කොමිෂන් සභා චක්‍රලේඛ මගින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය ලේකම් විසින් කැඳවනු ලබන දුක්ගැනවිලි කමිටුව වෙත ප්‍රවේශ විය හැකිය. දුක්ගැනවිලි කමිටුවේ (GC) ප්‍රධානියා වන්නේ ප්‍රාදේශීය ලේකම් කා හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නියෝජිතයෙකු විසිනි.

අනෙකුත් සාමාජිකයන් වන්නේ:

(a) පැමිණිලිකරු
(b) පැමිණිලිකරුගේ පවුලේ සාමාජිකයෙකු (අවශ්‍ය නම්)
(c) දුක්ගැනවිලි ඉදිරිපත් කල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී
(d) ව්‍යාපෘති කළමනාකරු හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයා (EE)
(e) CSO විසින් නම් කරන ලද කාන්තා නියෝජිතවරියක්
(f) CSO හෝ ආගමික නායකයෙකුගේ නියෝජිතයා
(g) කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයා
(h) අදාළ නියෝජිතායතන නියෝජනය කිරීම සඳහා වෙනත් ඕනෑම තාක්ෂණික නිලධාරියෙකු/වරුන් සමුපකාර විය හැක

GC සෑම මසකට වරක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කැඳවිය යුතුය. PIU විසින් GC රැස්වීම් කැඳවීමේදී ප්‍රාදේශීය ලේකම් කා කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කරනු ඇත. සලකා බලනු ලබන දුක්ගැනවිලි සංඛ්‍යාව සහ ඊට අදාළ පෙර ලිපි හුවමාරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ නිලධාරියා සමඟ බෙදාගනු ලැබේ.

විපතට පත් පාර්ශ්වයට සහ GC හි සාමාජිකයින්ට GC සඳහා සහභාගී වන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

නිශ්චිත අනුකූලතා/ දුක්ගැනවිලි පිළිබඳ GC ක්‍රියාදාමයට අදාළ සියලුම ද්‍රව්‍ය හොඳින් සාකච්ඡා කළ යුතු අතර පාර්ශ්වයන් සාධාරණ තීරණයකට පැමිණිය යුතුය. අවශ්‍ය නම්, ව්‍යාපෘති භූමියට පිවිසීම සිදු කළ හැකිය. ග්‍රාම නිලධාරී පළාත් පාලන නිලධාරීන්, තාක්ෂණික නිලධාරීන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ යුතුය.

දුක්ගැනවිලි GC වෙත යොමු කර සති දෙකකට වඩා නොඉක්මවන සාධාරණ කාලසීමාවක් තුළ එය විසඳීමට උත්සාහ කළ යුතුය. පරීක්ෂණ සඳහා වැඩි කාලයක් ගතවන්නේ නම් ඒ පිළිබඳව පැමිණිලිකරුට දැනුම් දිය යුතුය. හානියට පත් දේපල හෝ ජීවනෝපාය සඳහා වන්දි ගෙවීම සම්බන්ධ ඕනෑම ගැටළුවක් සමඟ GC වහාම කටයුතු කරනු ඇත.

GC හි තීරණ අගතියට පත් පාර්ශ්වයට ලිඛිතව දැනුම් දෙනු ලැබේ. තීරණවල පිටපත් තුනක් ලබා දෙනු ලැබේ: එක් පිටපතක් අගතියට පත් පාර්ශ්වයට, දෙවන පිටපත ව්‍යාපෘති කාර්යාලය සඳහා සහ තෙවන පිටපත ප්‍රාදේශීය ලේකම් සඳහා යොමු කරනු ලැබේ.

GC ට අදාළ අනුකූලතාවයට සාධාරණ විසඳුමක් ලබා ගැනීමට නොහැකි වුවහොත් හෝ කිසියම් නීතිමය ගැටලුවක් සම්බන්ධ වී ඇත්නම් හෝ පැමිණිල්ලක් GC ගේ නියෝගයට අනුකූල නොවේ නම්, විපතට පත් පාර්ශ්වයට විධිමත් අධිකරණයෙන් නීතිය හෝ ප්‍රජා සමථ මණ්ඩල (සමථ මණ්ඩලය) සහ/හෝ මානව හිමිකම් කොමිෂන් සභාව වැනි වෙනත් ආයතන වෙතින් සහනයක් ලබා ගැනීමට ඔහුට/ඇයට කාලය ලබා දෙමින් ඒ අනුව දැනුම් දෙනු ලැබේ.

## 11. නිගමනය

යෝජිත ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සහ එහි පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතා වැදගත් බව ESIA නිගමනය කරනු ලැබේ. ඉදිකිරීම් අතරතුර ව්‍යාපෘතිය කෙටි කාලීන සෘණාත්මක බලපෑම් ඇති වන අතර, ESMP ක්‍රියාත්මක කිරීම හරහා මේවා ඵලදායී ලෙස කළමනාකරණය කළ හැකි වේ. වැඩි දියුණු කළ බලශක්ති විශ්වසනීයත්වය සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම සඳහා සහය ඇතුළු දිගුකාලීන ප්‍රතිලාභ, තාවකාලික බාධාවන් ඉක්මවා යනු ඇත.

සම්බන්ධ කරගත හැකි නිලධාරියා:

**ඉන්ජිනේරු. කේ.එම්.ජී.යූ.ඩයස් මහතා**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මහ කොළඹ විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ හානි අවම කිරීමේ ව්‍යාපෘතිය**
දුරකථන: (+94 11) 205 8142; (+94 11) 205 8143; (+94 11) 205 8898

ෆැක්ස්: (+94 11) 205 8083 | විද්‍යුත් ලිපිනය: pdgctdp.prj@ceb.lk | වෙබ් අඩවිය: www.ceb.lk